# 1.10 ශ්‍රී ලාංකික බෞද්ධ අභිචාර විධි අතර පරිත්‍රාණ දේශනාව විෂයෙහි මහායාන බලපෑම් පිළිබඳ විමර්ශනයක්

පූජ්‍ය අලුත්ගම විමල රතන හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය

## ABSTRACT

බෞද්ධ සාරධර්ම හා සංකල්ප ජීවමාන සමාජය වෙත සම්ප්‍රේෂණය කරනු ලබන මාධ්‍යයන් අතර අභිචාරවිධිවලට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි. පරිත්‍රාණ දේශනාව, මළවුන් පිදීම, දෙවියන් පිදීම, අවාහ විවාහ චාරිත්‍ර, බලිතොවිල් ආදීය බෞද්ධ අභිචාර විධි හා සම්බන්ධ වී ඇත. මෙම අභිචාර විධි විමර්ශනය කිරීමේ දී දක ගත හැකි මූලික ලක්ෂණයක් නම් ඒවා හුදෙක් ශ්‍රී ලාංකික ථෙරවාදී සම්ප්‍රදායයේ පිළිගැනීම්වලට පමණක් සීමා වී නොමැති බවයි. දීර්ඝ කාලයක් තිස්සේ විවිධ සංස්කෘතික ලක්ෂණ සමඟ මිශ්‍ර වීමෙන් ඒවා වර්තමාන තත්වයට පරිණාමය වී ඇත. මෙම සම්මිශ්‍රණයන් අතර මහායාන බලපෑම් සුවිශේෂත්වයක් ගනී. බෞද්ධ අභිචාරවලට අදාළ ගායනා, සජ්ඣායනා, පූජා ද්‍රව්‍ය ආදී සෑම අංගයක ම මෙම මහායාන බලපෑම් දකගත හැකි ය. උක්ත අභිචාර විධි අතුරින් පරිත්‍රාණ දේශනාව කෙරෙහි මහායාන බලපෑම කෙසේවී ද යන්න මෙහි දී අපගේ විමර්ශනයට ලක් වේ.

එමෙන් ම එය අනු කොටස් කිහිපයකට වර්ග කොට අධ්‍යයනය කෙරේ.

1 'අභිචාර' යන්න හැඳින්වීම
2 පරිත්‍රාණ දේශනාවෙහි අන්තර්ගත මහායාන ලක්ෂණ

- ධාරණිය හා සමාන වන ගිනි පිරිත.

''ජාලො මහාජාලො - ජාලං මහා ජාලං ජාලිනෙ මහා ජාලිනෙ...

- මහා මයුර ධාරණිය හා මෝර පිරිත
- බහු බුද්ධ සංකල්පය ප්‍රකට කරන අටවිසි පිරිත.
- ජිනපඤ්ජරයෙහි අන්තර්ගත බෝධිසත්ව සංකල්පය.

''සම්පතෙතා බොධිසතෙතා චරණ යුගගතො හානුලොකෙක නාථො''

- ජිනපඤ්ජරයෙහි අන්තර්ගත ආතුරයාගේ ආරක්ෂාව සැලසෙන ආකාරය.

3 පරිත්‍රාණ දේශනාවේ ඓතිහාසික වර්ධනය
4 පරිත්‍රාණ දේශනාවේ අරමුණු හා පරමාර්ථ

මෙහි දී උක්ත කරුණු වලට අමතරව තවදුරටත් අපගේ විශේෂ අවධානය යොමුවන්නේ පරිත්‍රාණ දේශනාවෙන් වත්මන් සමාජය අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න හා ඒ කෙරෙහි ශ්‍රී ලංකාව තුළ පවතින ථෙරවාදි බෞද්ධ සම්ප්‍රදයයේ අනුබලය කෙසේවී ද යන්නයි.